පුනරීක්ෂන (3)

✓ පෙළ පොතෙහි පාඩම් අංක 9,10,11,12 පරිශීලනයෙන් පහත අභ්‍යාස සම්පූර්ණ කරන්න.

1. වරහන් තුළ දී ඇති වචනවලින් සුදුසු වචනය තෝරා හිස් තැන් පුරවන්න.
   1. පැහැදිලි ඡායාවක් ලබාගත හැකි වන්නේ .....මගිනි. (ඉටිපන්දම/විදුලි පන්දම් බල්බය)
   2. සමාන්තර ආලෝක කදම්බයක් අපසරණය කිරීමට යොදා ගන්නේ .....දර්පණයි. (උත්තල/අවතල)
   3. තල දර්පණවලින් සෑදෙන ප්‍රතිබිම්බ සෑමවිටම වස්තුවට .....(සමාන වේ/වඩා කුඩා වේ).
   4. උත්තල දර්පණවලින් සෑදෙන ප්‍රතිබිම්බ සෑමවිටම ..... (උඩුකුරු ය/යටිකුරු ය).
   5. යටිකුරු ප්‍රතිබිම්බ ලබා ගැනීමට භාවිත කළ යුත්තේ..... දර්පණ වේ. (අවතල/උත්තල)

2. දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
   1. තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්බයක ලක්ෂණයක් නොවන්නේ,
      i) තිරයකට ගත හැකි වීම ii) උඩුකුරු වීම
      iii) වස්තුවේ ප්‍රමාණයට සමාන වීම iv) පාර්ශ්වික අපවර්තනය වීම
   2. උත්තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්බයක ලක්ෂණයක් වන්නේ,
      i) යටිකුරු වීම ii) තිරයකට ගත හැකි වීම
      iii) වස්තුවට වඩා කුඩා වීම iv) වස්තුවට වඩා විශාල වීම
   3. ප්‍රතිබිම්බ තුනක් ලබා ගැනීමට තල දර්පණ දෙකක් ආනතව තැබිය යුතු කෝණය වනුයේ,
      i) 60^0 ii) 45^0 iii) 90^0 iv) 30^0
   4. තිරයකට ගත හැකි යටිකුරු ප්‍රතිබිම්බ ලබා ගැනීමට භාවිත කළ යුතු දර්පණ වර්ගය වනුයේ,
      i) උත්තල ය ii) අවතල ය iii) තල දර්පණ iv) ඉහත සියල්ලම ය

➢ පහත දැක්වා ඇති අණ්වීක්ෂයේ A සිට D දක්වා කොටස් නම් කරන්න.



➢

1. පහත දී ඇති වචනවලින් සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.
(වේගය, ඝන, මාධ්‍යයක්, කම්පන, වාතය)

I. ධ්වනිය හෙවත් ශබ්දය නිපදවන්නේ..... මගිනි.
II. ධ්වනිය ගමන් කිරීමට.....අවශ්‍ය වේ.
III. ධ්වනිය වඩා වැඩි වේගයකින් ගමන් කරන්නේ .....මාධ්‍යය තුළිනි.
IV. බටනලාවක ධ්වනිය නිපදවන්නේ ..... කම්පනය වීමෙනි.

➢ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(i) ජීවීන්ගේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය වන්නේ කුමක් ද?

1. සෛලය 2. පටකය 3. අවයවය 4. පද්ධතිය

(ii) ශාකයක ජලය හා ඛනිජ ලවණ පරිවහනය කරන්නේ කුමන පටකය මගින් ද?

1. ශෛලම 2. ප්ලෝයම 3. බාහිකය 4. මජ්ජාව

(iii) ආහාර ජීරණ පද්ධතියට අයත් නොවන අවයවය කුමක් ද?

1. අක්මාව 2. ශ්වාසනාලය 3. මහාන්ත්‍රය 4. ගුදය

(iv) ශ්වසන පද්ධතියටත් ආහාර ජීරණ පද්ධතියටත් පොදු ව්‍යුහය වනුයේ?

1. ස්වරාලය ය. 2. අනුශ්වාසනාලිකා ය.
3. අන්නස්‍රෝතය ය. 4. ග්‍රසනිකාව ය.

(v) කුඩා අන්ත්‍රය තුළ සිදු නොවන ක්‍රියාව කුමක් ද?

1. ජීරණ යුෂ එකතු වීම
2. ආහාර ජීරණය සම්පූර්ණ වීම
3. ජීරණ ඵල අවශෝෂණය වීම
4. ආහාරය කුඩා කැබලි බවට පත් කිරීම

➢ (02) පහත වගුව සම්පූර්ණ කරන්න.

අවයවය	කෘත්‍ය
1. ආමාශය	
2. කුඩා අන්ත්‍රය	
3. මහාන්ත්‍රය	
4. නාස් කුටීර	
5. ස්වරාලය	